# ශ්‍රී ලංකාවේ

# ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති කෙටුම්පත

# (Draft National Social Protection Policy)

පටුන (Table of Contents)


1. හැඳින්වීම (Introduction)
   - 1.1 දළ විශ්ලේෂණය (Overview)
   - 1.2 වත්මන් සමාජ ආරක්ෂණ පද්ධතියේ අභියෝග තක්සේරු කිරීම (Assessment of challenges in the current system)
   - 1.3 ප්‍රතිපත්තිය පිළිබඳ තාකරීකත්වය (Rationale for the Policy)
   - 1.4 විෂයපථය (Scope)
2. ප්‍රතිපත්තියෙහි මූලධර්ම (Policy Principles)
3. ප්‍රතිපත්තිය සඳහා ක්‍රමෝපායික කායර්රාමුව (Strategic Framework for the Policy)
   - 3.1 දැක්ම (Vision)
   - 3.2 මෙහෙවර (Mission)
   - 3.3 ප්‍රතිපත්තියෙහි අරමුණු (Policy Objectives)
4. ප්‍රතිපත්ති ප්‍රකාශන (Policy Statements)
5. අදාළත්වය (Applicability)
6. ක්‍රියාත්මක කිරීම (Implementation)
7. නිවර්වනය (Definitions)

ඇමුණුම **1** සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සහ නීති සම්පාදන (Relevant Policies and Legislation)

ඇමුණුම **2** ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර්යේ දළ සැලැස්ම**: 2030** කරා ගමන්මග (Outline of Forthcoming National Social Protection Strategy: Road to 2030)

# ශ්‍රී ලංකාවේ
# ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති කෙටුම්පත

# (Draft National Social Protection Policy)

## 1. හැඳින්වීම (Introduction)

### 1.1 දළ විශ්ලේෂණය (Overview)


මනාව සැලසුම් කළ සමාජ ආරක්ෂණ පද්ධති, මානව ප්‍රාග්ධනය හා ඵලදායිතාව ඉහළ නැංවීමට, අසමානාත්මතා අවම කිරීමට සහ පරම්පරා අතර පවත්නා දිළිඳු බවෙහි චක්‍රය අවසන් කිරීමට බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකිය. ආර්ථික හා මූල්‍ය කම්පන සෘජුව ම අවම කිරීමේ හැකියාව ද ඒවා සතු ය. එමගින් මතු කෙරෙන ඔරොත්තු දීමේ හැකියාව (ප්‍රත්‍යාස්ථිතිය) තුළින් දිළිඳු බවින් මිදීමේ අවස්ථාව ජනතාවට සැලසෙනු ඇත. එවිට, ඔවුන් සමාජයට වැඩදායී, කාර්යක්ෂමතාව සපිරි සාමාජිකයන් බවට පත් වනු ඇත. එවැනි ජනතාවකට සමාජයේ ස්ථාවරත්වය දිරි ගැන්වීමට මෙන්ම අනපේක්ෂිත ප්‍රතිවිපාක වල අවදානමට ලක්විය හැකි නිවැසියන්/පවුල් ආරක්ෂා කිරීමට අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණයන් පිළිබඳව දේශපාලන සහ මහජන සහය පවත්වා ගැනීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට ද හැකි වනු ඇත.

සමාජ ආරක්ෂණය වෙත ප්‍රවේශය මානව හිමිකමක් වශයෙන් ඉහළින්ම පෙන්වා දී ඇති ප්‍රධානතම ජාත්‍යන්තර ගිවිසුම්, සම්මුති සහ ගෝලීය කැපවීම් රැසක් ඇත: එකී ප්‍රධානතම ගිවිසුම් අතර මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශනය, ආර්ථිකය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, සමාජ හා සංස්කෘතික හිමිකම්, සමාජ ආරක්ෂණ (අවම ප්‍රමිතීන්) සම්මුතිය, සමාජ ආරක්ෂණ මට්ටමෙහි නිදෙර්ශය, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ද වේ. සමාජ ආරක්ෂණය, 2030 සඳහා වන තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ ද වැදගත් කොටසකි. තිරසර සංවර්ධන ඉලක්ක (SDG) 1 මගින්, සෑම තැනකම සියලු ආකාරයෙන් පවත්නා දිළිඳු බව 2030 වනවිට නිමා කරන ලෙසට සියලු රටවලින් ඉල්ලා සිටියි. සමාජ ආරක්ෂණය යනු, එම ඉලක්කය සාක්ෂාත් කරගැනීමට අත්‍යවශ්‍ය මූලධර්මයකි. එය, “සියලු මට්ටම් හා සියලුදෙනා වෙනුවෙන්ම ගනු ලබන පියවර සහිත, ජාතික වශයෙන් ගැළපෙන සමාජ ආරක්ෂණ පද්ධති, සහ 2030 වනවිට දිළිඳු හා අවදානමට ලක් විය හැකි අය ප්‍රමාණවත් ලෙස ආවරණය වීම සිදු කෙරෙන” අයුරින් ක්‍රියාත්මක කරන ලෙසට ඉල්ලා සිටින තිරසර සංවර්ධන ඉලක්ක 1, 3 මගින් වඩාත් ඉස්මතු කර ඇත. පුළුල් සමාජ ආරක්ෂණ පද්ධතියකට, අනෙකුත් තිරසර සංවර්ධන ඉලක්ක

සාක්ෂාත් කරගැනීමේ ප්‍රගතිය පහසු කරවන ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකිය. තවද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 වැනි වගන්තිය මගින් සමාජ ආරක්ෂණය යනු ප්‍රධානතම ප්‍රතිපත්ති මූලධර්මයක් යැයි පෙන්වා දෙමින්, “සාධාරණ හා නිදහස් සමාජයක් බිහි කිරීම” වෙනුවෙන් සපුරාලිය යුතු අරමුණක් සේ සලකා සතුටුදායක ජීවන තත්ත්වයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී ඇත. මෙම මුල් ම ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (National Social Protection Policy – NSPP) විසින් ශ්‍රී ලංකාව අත්සන් කළ හා අනුමත කළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් සැලකිල්ලට ගනියි. එමගින් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය මූලධර්ම ශක්තිමත් කිරීමටත්, පවත්නා නීති සම්පාදනයන්ට ඌණපූරණ සැපයීමටත් ඉලක්ක කෙරෙයි. (ඇමුණුම 1).

සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ පවත්නා හැකියාව සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති සම්පාදන, පාලනය, හා ආයතනික වැඩපිළිවෙළ මෙන්ම මෙහෙයුම් පද්ධති ඇති කිරීම තුළින් සමෝධානික සමාජ ආරක්ෂණ පද්ධතියක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පදනම ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් පෙන්නුම් කෙරෙයි. තවද, ශ්‍රී ලංකාව සමාජ ආරක්ෂණය තුළින් සාක්ෂාත් කරගැනීමට ඉලක්ක කරන දිගු-කාලීන අරමුණු, එම අරමුණු ළඟා කරගැනීම උදෙසා සංවර්ධනය කරන සමාජ ආරක්ෂණ පද්ධතියෙහි ප්‍රධානතම අංග, සහ මෙම ප්‍රතිපත්තිය යටතේ ගනු ලබන සියලු තීරණ වලදී මගපෙන්වනු ඇති මූලධර්ම ආදී කරුණු ද මෙම ප්‍රතිපත්තිය මගින් විස්තර කෙරෙයි.

සමාජ ආරක්ෂණය පිළිබඳ සමෝධානික හා කාර්යක්ෂම පද්ධතියක් සැකසීමේ පොදු මගපෙන්වුමක් හා සැලසුම්කරණ මෙවලමක් වශයෙන් මෙම ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (NSPP) භාවිත කළ හැකිය. එකී සමෝධානික පද්ධතිය මගින් නියෝජිතායතන, වැඩසටහන් සහ මැදිහත්වීම් අතර ද්විකරණය වලක්වමින් සහයෝගීතාව දිරි ගන්වනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රියාවලියෙහි විනිවිද භාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවෙනු ඇත. එවිට, වඩාත් ඵලදායී මැදිහත්වීම් සිදු කිරීමේ අවස්ථාව සැලසෙනු ඇත. ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග (NSPS) සමග ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (NSPP) එක් වූ විට, වඩාත් සාධාරණාත්මක සහ කාර්යක්ෂම සමාජ ආරක්ෂණ පද්ධතියකට මග සලසන කාර්රාමුවක් සපයනු ඇත. ජීවන චක්‍රය පුරාවට සියලු පුරවැසියන්ට සහය ලබාදීමට එකී සමාජ ආරක්ෂණ පද්ධතිය සමත් වනු ඇත. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්ෂේත්‍රයට දිගු-කාලීන දැක්මක් සපයනු ලබන අතර, ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග වෙතින් ඉදිරි ගමන සම්බන්ධයෙන් විශේෂිත කාලසීමාවක් සඳහා ක්‍රමෝපායික මගපෙන්වුමක් ලබාදීම සිදු වේ. ඇමුණුම 2 මගින්, ඉදිරි ජාතික සමාජ ආරක්ෂණ ක්‍රමෝපාය පිළිබඳ දළ සැලැස්ම : 2030 දක්වා ගමන්මග සපයනු ලබයි.




## 1.2 වත්මන් ක්‍රමවේදයේ අභියෝග තක්සේරු කිරීම (Assessment of challenges in the current system)

කාලයක් තිස්සේ සංවධර්නය වෙමින් පැවති නීතිමය සහ ප්‍රතිපත්තිමය ලේඛන, පාලන තන්ත්‍රයන්ගේ මතවාද සහ ජාත්‍යන්තර ගිවිසුම් සහ සම්මුති වල අනුබලයට ලක්වෙමින් ක්‍රමයෙන් පරිණාමනය වී ඇත. වෙනත් දෑ අතර, සමාජ ආරක්ෂණය පාලනය කිරීම පිළිබඳ ප්‍රවේශයෙහි තිරසර භාවය අඩුවීමට ද එය හේතු වී ඇත. එපමණක් නොව, විවිධ ලේඛන අතර පවත්නා බැඳීම් වල ද, ඒවායෙහි ප්‍රතිවිපාක වශයෙන් මෙකී ලේඛන මගින් සංස්ථාපිත ආයතන ගැන ද පැහැදිලි භාවයක් දක්නට නොමැත. කෙසේ වෙතත්, ,පසුගිය කාලයේ සමාජ ආරක්ෂණය තනි අංගයක් ලෙස සංකල්ප ගත කර හෝ කළමණාකරණය නොකළ බැවින්, සමාජ ආරක්ෂණය උදෙසා වූ ජාතික දැක්මක්, ප්‍රතිපත්තියක්, හෝ උපායමාගර්යන් තිබී නොමැත. එනයින් බලන කල, සෑම මට්ටමක දී ම පාලනයෙහි දුවර්ලතා වලට මෙන්ම පැනවීමේ හා ක්‍රියාත්මක කිරීමේ අභියෝගයන් ඇති වීමට හේතු වී ඇත්තේ ද මෙකී එකිනෙකට ගැළපීමක් (coherence) නොමැතිකම ය. එකිනෙකට ගැළපෙන සමාජ ආරක්ෂණ පද්ධතියක් සහතික කිරීමෙහි ලා, එකී අභියෝගයන්ට අමතරව නිසි කටයුතු කළ යුතු වන පද්ධතිමය ගැටලු ද රාශියක් වේ. සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් රජයේ පැහැදිලි නිවර්චනයක් ද ශ්‍රී ලංකාවෙහි නොමැත. ඒ අනුව, සමාජ ආරක්ෂණයෙහි අඩංගු විය යුතු කරුණු මොනවාද යන්න වගරීකරණය වීමක් ද නැත. කරුණු එසේ හෙයින්, සමාජ ආරක්ෂණ ක්ෂේත්‍රයෙහි සීමා-මායිම් මොනවාද යන වග පවා පැහැදිලි නැත.

අදාළ ප්‍රතිපත්ති සංවධර්නයට, නීති සම්පාදන යෝජනා කිරීමට සහ ක්ෂේත්‍රය අධීක්ෂණයට මූලිකත්වය ගෙන කටයුතු කළ හැකි නියෝජිතායතනයක් නොමැතිකම මෙහි පවත්නා සැලකිය යුතු අඩුපාඩුවකි. රජයේ විවිධ අමාත්‍යාංශ සහ දෙපාතර්මේන්තු විසින් සමාජ ආරක්ෂණ සේවාවන් රැසක් ලබා දුන්න ද, මූලිකත්වය ගෙන ක්‍රියා කරන නියෝජිතායතනයක් නොමැතිකම නිසා, එකී සේවාවන් ලබා දී ඇත්තේ සම්බන්ධීකරණය හෝ ප්‍රතිපත්ති ගැළපීම ඉතා අඩුවෙන් පැවති තත්ත්වයන් යටතේ ය. එක හා සමාන ආකාරයේ වැඩසටහන් ද්විකරණය වීම එහි අනිටු ප්‍රතිඵලයකි. කායර්සාධනයට බලපාන වගවීමක් නොමැතිකම නිසා අධික පිරිවැයකින් යුතු අකායර්ක්ෂම පද්ධතියක් බිහි ව ඇත. ඩිජිටල් හා දත්ත යොදා ගැනීමේ හැකියාවෙන් ප්‍රමාණවත් ප්‍රතිඵල ලබාගැනීමට ද මෙතෙක් කටයුතු කර නොමැත. පද්ධතිය තුළ පවත්නා එකිනෙකට ගැළපීමක් නොමැති බව මගින් අකායර්ක්ෂමතාව ඉහළ නැංවී ඇත. කායර්සාධනයට පමණක් නොව ඵලදායිතාවට ද එයින් අනිටු බලපෑමක් ඇති වේ.

ඉදිරියේ දී, ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතිය තව තවත් අභියෝග වලට මුහුණ දෙනු ඇත. එහිදී, මූලික වශයෙන් මතු වනු ඇත්තේ ජනවිකාස වෙනස්කම් ආශ්‍රිත අභියෝගයන් ය. දරු උපත් සංඛ්‍යාව අඩු වීම සහ වයස්ගත වන පුද්ගල සංඛ්‍යාව වේගයෙන් වැඩි වීම නිසා, වැඩිහිටියන්ගේ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් සමාජ ආරක්ෂණ පද්ධතියේ හැකියාව පිළිබඳ ගැටලු පැන නගියි. ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයන් වැනි අවදානමට ලක් විය හැකි කණ්ඩායම් වලට වැඩි අවධානයක් යොමු කළ යුතු වීම තවදුරටත් අත්‍යවශ්‍ය කරුණක් වනු ඇත. මෙමගින් වඩාත් ඉස්මතු වන්නේ දැරිය හැකි, පහසු ප්‍රවේශය සහිත සමාජ රැකවරණයක අවශ්‍යතාවයි.


වසංගත හා ස්වාභාවික ආපදා ඇතුළු එකිනෙකට බලපෑම් ඇති කරවනසුලු කම්පන බොහොමයකට මුහුණ පෑමට ද ශ්‍රී ලංකාවට සිදු විය. තත්ත්වය එසේ වුවද, සමාජ ආරක්ෂණ පද්ධතිය ප්‍රමාණවත් අයුරින් අනුවතර්නය වී නොමැත. දැනටමත් දරිද්‍රතා රේඛාවට මඳක් ඉහළින් ජීවත් වන පුද්ගලයන් විශාල සංඛ්‍යාවක්, ආථර්ික හෝ දේශගුණික කම්පන ඇති වන විටෙක, තව තවත් පහළ තත්ත්වයකට ඇද වැටීමේ අවදානමක් පැවතීම, එහි අනිටු විපාකයකි.

කෙසේ වෙතත් මෙහිදී මූලික ප්‍රතිසංස්කරණයක් කිහිපයක් ම සිදු කර ඇත. සමාජ ආරක්ෂණ ජාලය සම්බන්ධයෙන් වන අය-වැය ප්‍රතිපාදන ඉහළ නැංවීමට රජය කටයුතු කර ඇත. පුරවැසියන්ගේ ජීවන චක්‍රයන් පුරාවටම, අවශ්‍ය අවස්ථාවන් හි දී ප්‍රමාණවත් අන්දමින් හා කායර්ක්ෂම ලෙස ඔවුන් රැකගත යුතුව පවතියි. ඒ වෙනුවෙන් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මගින් පුළුල් සමාජ ආරක්ෂණ අවකාශයක් නිමර්ාණය කළ යුතු ය.

## 1.3 පනතෙහි තාකර්ිකත්වය (Rationale for the Policy)

පුළුල් ප්‍රතිපත්ති මගපෙන්වුමක් සහ සමෝධානික වූ ක්‍රමෝපායික කායර්රාමුවක් නොමැතිකම සමාජ ආරක්ෂණ පසුබිම තුළ දැනට පවතින අභියෝග වලට ප්‍රධාන හේතු ලෙස සැලකිය හැකිය. එහි ප්‍රතිඵල ලෙසට මතුව ඇති අඩුපාඩු ද බොහෝ ය. ප්‍රතිලාභ ලබන්නන් ආවරණය කෙරෙන ප්‍රමාණය මෙන්ම සලසන ප්‍රතිලාභ වල ප්‍රමාණවත් භාවය පිළිබඳ ගැටලු ද එකී අඩුපාඩු අතර වේ. එපමණක් නොව, වත්මන් සමාජ ආරක්ෂණ පද්ධතියට එක් කර තිබෙන, එකිනෙකට සම්බන්ධයක් නොමැති වැඩසටහන්, යෝජනාක්‍රම, ආයතන සහ සැලසුම් මගින් මනාව ඔප්පු කර ඇත්තේ ඒවා තුළ පවත්නා සීමිත කායර්ක්ෂමතාවයි. සංවධර්නය පිළිබඳ ප්‍රතිඵල වලට ඇති අනුබලය ප්‍රමාණවත් නොවීමට හේතුව එයයි.

## 1.4 විෂයපථය (Scope)




මෙම ප්‍රතිපත්තිය විසින් සමාජ ආරක්ෂණය නිවර්වනය කරනු ලබන්නේ, තනි පුද්ගලයින්ට සහ සමාජයන්ට අවදානම් හා අස්ථාවරත්වය කළමනාකරණයට සහය දෙන, දිළිඳු බවින් හා අසමානාත්මතා වලින් ඔවුන් සුරකින, සහ ජීවන චක්‍රය පුරාවටම ඔවුන්ට ආථර්ික අවස්ථාවන් වෙත ප්‍රවේශය සලසන ප්‍රතිපත්ති හා වැඩසටහන් රැසක් වශයෙනි.

සමාජ ආරක්ෂණයේ ඉලක්ක තුන ලෙසට සැලකෙන්නේ පුද්ගලයින්ගේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම, සාධාරණත්වය සහ අවස්ථාවන් සැලසීමයි. ඉහත සමාජ ආරක්ෂණ නිවර්වනයෙහි ඇතුළත් කරුණු සාක්ෂාත් කිරීමෙහි ලා මෙකී ඉලක්ක තුන වෙනුවෙන් උපකාරී වන තවත් කරුණු රැසක් අප විසින් ආධාරක ලෙසට කාණ්ඩගත කර ඇත. නව සමාජ ආරක්ෂණ පද්ධතියට ඇතුළත් මූලික ආධාරක වල සමාජ සහනාධාර, සමාජ රැකවරණය, සමාජ රක්ෂණය, සහ ශ්‍රම වෙළඳපොළ සහ දිළිඳු අය අතර ස්වයං-රැකියා හා වැටුප් සහිත රැකියා දිරිගැන්වීමේ ප්‍රතිපාදන හා පුහුණු වැනි සමෝධානික සේවා පැකේජ සැපයීම ඇතුළත් වැඩසටහන් (productive inclusion programmes) අන්තගර්ත වේ.

(i) <u>සමාජ සහනාධාර</u> **<u>(Social assistance)</u>**, ප්‍රමාණවත් සහය සම්බන්ධයෙන් කිසිදු පිළිසරණක් නොමැති, අවදානමට ලක් විය හැකි කණ්ඩායම් වෙත ලබා දීම. සමාජ සහනාධාර නිවර්වනය කර ඇත්තේ, කිසියම් අවම මට්ටමක ආථර්ික යහපැවැත්මක් සහතික කිරීම මගින් කුටුම්භ/පවුල් සුරැකීමට නිමර්ාණය කළ දායක නොවන මුදල් මාරු කිරීමේ වැඩසටහන් හෝ ආරක්ෂිත ජාලය ලෙසට ය. බොහෝ විට ඒවා නිමර්ාණය කරන්නේ, ලබන්නාගේ මානව සහ භෞතික ප්‍රාග්ධනය වෙත ආයෝජනය

වැඩිදියුණු කිරීම තුළින් ඔවුන් දිරිගැන්වීමේ කාර්යභාරයක් ඉටු කිරීමට හා දිළිඳු බවින් මිදීම වෙනුවෙන් ඔවුන්ට සහය වීමට ය.

(ii) <u>**සමාජ රැකවරණය (Social care),**</u> යනු, තමන් රැකබලා ගැනීමේ හැකියාවක් නොමැති පුද්ගලයන් වෙත සහය සලසන ක්‍රියාකාරකම් සහ සේවාවන් රැසකි; තනි පුද්ගලයින්ගේ/පවුල් වල/ කුටුම්භයන්ගේ සහ පුළුල් සමාජයේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම හෝ දිරිගැන්වීම අරමුණු කරගෙන නිමර්ාණය කළ ක්‍රියාකාරම් සහ සම්පත් ය.

(iii) <u>**සමාජ රක්ෂණය (Social insurance),**</u> යනු මහලු වයස, ආබාධ තත්ත්වයන්, ගෘහමූලිකගේ (නිවසේ අවශ්‍යතා සපුරාලන ප්‍රධානියාගේ) මරණය, මෙන්ම විවිධ සෞඛ්‍යමය සහ ආර්ථික කම්පන සම්බන්ධයෙන් සපයනු ලබන හෝ ලබාදීමට නියමිතව පවතින හෝ අනිවාර්ය කළ රක්ෂණ වේ. සමාජ රක්ෂණ වැඩසටහන්, බොහෝ දුරට විධිමත් සහ අවිධිමත් රැකියා හා සම්බන්ධ වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, දායකත්වය සහිත සහ දායකත්වය රහිත ලබන රක්ෂණ යෝජනා ක්‍රම, සමාජ රක්ෂණ[1] වශයෙන් සලකනු ලබයි.


(iv) <u>ශ්‍රම වෙළඳපොළ සහ දිළිඳු අය අතර ස්වයං-රැකියා හා වැටුප් සහිත රැකියා දිරිගැන්වීමේ ප්‍රතිපාදන හා පුහුණු වැනි සමෝධානික සේවා පැකේජ[2] සැපයීම ඇතුළත් වැඩසටහන්</u> <u>**(Labour market and productive inclusion programmes)**</u>, යනු, නිෂ්ක්‍රීය (රැකියා නොමැති අයට මූල්‍ය සහය දෙන නමුත් රැකියා අවස්ථා ලබා නොදෙන) සහ සක්‍රීය (රැකියා නොමැති අය ඍජුව ම ශ්‍රම වෙළඳපොළ වෙත ප්‍රවේශය ඉහළ නංවන) යන දෙයාකාරයේ ම මැදිහත්වීම් ඇතුළත් වන වැඩසටහන් ය. ඒවා මගින් සුනිසි රැකියා න්‍යායපත්‍රයකට දායකත්වය සැපයේ. විරැකියාවේ සහ නියමිත කාලයට පෙර විශ්‍රාම ගනු ලබන අයගේ වියදම් හා බැඳුණු ප්‍රතිපත්ති (Passive labour market policies) සහ වැඩසටහන් වලට මූලික කම්කරු ප්‍රමිතීන්, රැකියා සුරක්ෂිතතා ප්‍රතිපාදන, සහ සිදු කරන කාර්ය තත්ත්වයන්ගේ වැඩිදියුණුව වෙත දක්වන අනුකූලතාව ද අයත් වේ. සක්‍රීය වැඩසටහන් මගින් තනි පුද්ගලයන්ගේ/ ලැබුම්කරුවන්ගේ මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම සිදු කරනු ලබන්නේ රැකියාවේ නිරතවෙමින් පුහුණුව ලැබීම ඇතුළු පුහුණු සඳහා සහය ලබාදීමත්, අතරමැදි සේවාවන් හා රැකියා නිමර්ාණය තුළින් රැකියා අවස්ථාවන් වෙත පහසුකරණය සැලසීමත් මගිනි. සමෝධානික සේවා පැකේජ සැපයීම ඇතුළත්

[1] ඓතිහාසික වශයෙන් ශ්‍රී ලංකාවේ, සමාජ රක්ෂණ හඳුන්වන්නේ සමාජයීය සුරක්ෂිතතාව වශයෙනි. මෙම පනතේ දී, වඩාත් වත්මන් වූත් ජාත්‍යන්තර පිළිගැනීමකින් යුතු වූත්, සමාජ රක්ෂණය යන වචනය භාවිත කරනු ලබයි.

[2] මෙම ප්‍රතිපත්තියට අයත් රාමුව තුළ දී, ශ්‍රම වෙළඳපොළ සම්බන්ධයෙන් මැදිහත්වීම් වලට ඇති ඉල්ලුම ආශ්‍රිත ප්‍රතිපත්ති ගැන සාකච්ඡා කරනු නොලබයි.

වැඩසටහන් මගින් අවදානමට ලක් විය හැකි කණ්ඩායම් වලට තිරසර ජීවනෝපාය අවස්ථා උදා කරගැනීමට සහය දෙන්නේ මූල්‍ය සහය, පුහුණු ලබාදීම සහ පුහුණු කිරීම හා උපදේශනය ඇතුළත් මැදිහත්වීමේ පැකේජයක් හරහා ය.

## 2. පනතෙහි මූලධර්ම (Policy Principles)




ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (National Social Protection Policy – NSPP) පදනම් ව ඇත්තේ, පහත දක්වා ඇති මූලික මූලධර්ම මත ය:

- සාධාරණත්වය සහ ඇතුළත් භාවය **(Equity and inclusion):** සියලු පුරවැසියන් හට තම ජීවන චක්‍රය පුරාවට, අවශ්‍ය අවස්ථාවන් හි දී ප්‍රමාණවත් ආර්ථික සහ සමාජ ආරක්ෂණයක් වෙත ප්‍රවේශය හිමි විය යුතු ය. සාධාරණත්වයේ සහ සමාජයීය ඇතුළත් භාවයේ මූලධර්ම වලට අනුව සමාජ ආරක්ෂණ පද්ධති නිමර්ාණය හා ක්‍රියාවට නැංවීම යනු, එසේ ලබාදෙන පද්ධති මගින් අවදානම් සහ අවාසිසහගත කණ්ඩායම් විසින් මුහුණ දෙන අභියෝග සහ බාධක වෙත විශේෂිත අවධානය යොමු කරනු ලැබීමයි.

- ඔරොත්තු දීම **(Resilience):** අනුහුරු විය හැකි සමාජ ආරක්ෂණ පද්ධති දිරිගැන්වීම තුළින්, දිළිඳු හා අවදානමට ලක් විය හැකි කුටුම්භ වල පුරවැසියන් හට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට උපකාරී විය හැකිය. එහිදී, ඔවුන් දිළිඳු බව තුළ (ගැඹුරටම) කිඳා නොබසින

බව සහතික කරමින්, කම්පන වලට සූදානම, ඒවා සාථර්කව හසුරුවා ගැනීම, සහ ඒවාට අනුහුරු වීම පිණිස ඔවුන් සතු විය යුතු ධාරිතාව ඉහළ නැංවීමට කටයුතු කළ යුතු ය.

- ප්‍රවේශීය සහජීවනය (**Coherence in approach**): සමාජ ආරක්ෂණය පැවතිය යුත්තේ, පුළුල් ජාතික සංවධර්න උපායමාගර්යන් තුළ වන එක් අංගයක් ලෙසට ය. එහිදී, අභිමත සංවධර්න ඉලක්ක සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් රජයෙහි හැකියාව ඉහළ නැංවිය හැකි පරිදි ප්‍රතිපත්ති අතර ගැලපීම සහතික කිරීම ද අවශ්‍ය වේ. එසේම, එකිනෙක හා සම්බන්ධීකරණය වන ආකාරයකින් සමාජයීය සහ ආථර්ික ප්‍රතිපත්ති වැරගැන්වීම ද කළ යුතු වේ. එපමණක් නොව, රජය, පුද්ගලික අංශය සහ රාජ්‍ය-නොවන සංවිධාන විසින් අනුගමනය කරන වැඩපිළිවෙළ එකිනෙකට ඌණපූරණ සැපයිය යුතු වන්නේ, බහු-ආංශික ප්‍රවේශයෙහි ආවරණය හා ඵලදායිතාව උපරිමයට පත් කරගැනීම පිණිස ය. සමාජ සහනාධාර වැඩසටහන් තෝරා ගන්නා විට, එනම්, තිරසර ජීවනෝපාය අවස්ථාවන් වෙත පහසුකරණය සැපයීමේ දී ඉන් ප්‍රගතිය හා සාථර්කත්වය ලැබූ පසු ඉන් සවිබලගැන්වීමේ ප්‍රවේශයන් (graduation approach) ගැනීම වැදගත් වේ.

- යහ පාලනය සහ විනිවිද භාවය (**Good governance and transparency**): සමාජ ආරක්ෂණ පද්ධති පදනම් විය යුත්තේ, සවිමත් ආයතනික හා නෛතික කායර්රාමුවක් තුළ ය. එසේම, සෑම අවස්ථාවක දී ම, රාජ්‍ය අංශයෙන් සිදු කරන කටයුතු දාමයෙහි විනිවිද භාවය සහ වගවීම සහතික කිරීම ද කළ යුතු වේ. ඉතාමත් හොඳින් සිදු කරන අනුබල තක්සේරු කිරීම් හා සාක්ෂි-මත පදනම් වූ ප්‍රතිපත්ති-සම්පාදනය මගින් වැඩසටහන් වලින් උපරිම ප්‍රතිඵල ලබාගැනීමට ඉඩ සැලසෙනු ඇත. කායර්ක්ෂම අන්දමින් විනිවිද භාවය සහතික කිරීම උදෙසා, තොරතුරු ලබාගැනීමට, ඒවාට ප්‍රවේශවීමට හා ඒවා ජනතාව අතර ප්‍රචලිත කිරීමට හැකියාව පැවතිය යුතු ය. සහභාගිත්වය සහතික කිරීමේදී, තොරතුරු වෙත ප්‍රවේශය පැවතීම අතිශය වැදගත් ය. එසේම, දූෂණය, සේවාදායකත්වයන් සහ අකායර්ක්ෂමතා වැළැක්වීමට හෝ අවම කිරීමට ද ඊට හැකි වනු ඇත. විනිවිද භාවය සහ යහ පාලනය එකිනෙකින් වෙන් කළ නොහැකි අයුරින් බැඳී ඇත්තේ එනිසා ය.

- පිරිවැය කායර්ක්ෂමතාව සහ ඵලදායීතාව (**Cost efficiency and effectiveness**): සමාජ ආරක්ෂණ වැඩසටහන් සහ ප්‍රතිපත්ති වල සමීප සම්බන්ධීකරණය සහ අනුරූපී භාවය මගින් පද්ධතිය තුළ ද්විකරණය සිදු වීම සහ අතිරික්තයන් ඇති වීම අවම කෙරෙනු ඇත. ඉලක්ක කිරීම් කායර්ක්ෂමව සිදු කිරීම වැනි පියවර තුළින් වැඩි වශයෙන් සහය අවශ්‍ය පුද්ගලයින් හට පද්ධතිය මගින් ප්‍රමුඛතාව ලබාදිය හැකි බවට සහතික වීම ද මීට අයත් වේ. එවිට, දුලර්භ සම්පත් වඩාත් කායර්ක්ෂම අන්දමින් බෙදා දීමේ අවස්ථාව සලසා ගත හැකි වනු ඇත.

- තිරසර බව (Sustainability): ජීවන චක්‍රයන් පුරාවට මෙන්ම පරම්පරා පුරාවට ද පවත්නා සමාජයීය බැහැර කිරීම් සහ ආර්ථික අසමානාත්මතා නිසි පරිදි විසඳීමෙහි ලා ගනු ලබන පියවර සාර්ථක වීමට නම්, සමාජ ආරක්ෂණය වෙත දිගු කාලීන දේශපාලනමය කැපවීමක් තිබිය යුතු ය. එය සැබැවින්ම අත්‍යවශ්‍ය කරුණකි.

- දිරිගැන්වීම් වල ගැළපීම (Incentive compatibility): සමාජ ආරක්ෂණ වැඩසටහන් නිමර්ාණය කළ යුත්තේ තනි පුද්ගලයන් හට සේවයේ නිරතව, ඉතිරි කරමින්, ආයෝජනය කිරීම සඳහා ධනාත්මක දිරිගැන්වීම් සපයනු ලබන ආකාරයෙනි. ඊට අඩංගු කළ යුතු කරුණු අතර, අවධානය යොමු කළ යුතු දෑ නැවත-පෙළ ගැස්වීම, සහ සමාජ රක්ෂණ මැදිහත්වීමක් වෙනුවෙන් දායකත්වය සැපයීම, සහ සමාජ සහනාධාර වැඩසටහන් වලින් සවිබලගැන්වීම ආදිය ද වේ.

## 3. ප්‍රතිපත්තිය සඳහා උපායමාගර්ික කායර්රාමුව (Strategic Framework for the Policy)

ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය සඳහා වන ක්‍රමෝපායික කායර්රාමුවට දැක්ම හා මෙහෙවර පිළිබඳ ප්‍රකාශන ඇතුළත් වේ. ශ්‍රී ලංකාව, අනාගතයේ දී සාක්ෂාත් කරගැනීමට අදහස් කරන දෑ (දැක්ම), සහ රජය විසින් ඒවා සාක්ෂාත් කරගන්නා අයුරු (මෙහෙවර) එමගින් පැහැදිලි කෙරෙයි. ඉන් අනතුරුව, දැක්ම හා මෙහෙවර ඉටු කරගැනීමෙහි ලා ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි කායර්භාරය කුමක් ද යන්න ප්‍රතිපත්තියෙහි පරමාර්ථ විසින් ඉස්මතු කර දක්වයි.

### 3.1 දැක්ම (Vision)

ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි පුළුල් දැක්ම වන්නේ, අවදානම් කළමනාකරණය පිළිබඳ සියලු පුරවැසියන්ගේ ධාරිතාවන් දියුණු කිරීම සහ තිරසර ජාතික සංවධර්නයක් උදෙසා අර්ථාන්විත දායකත්වයක් ලබාදීම තුළින්, සාධාරණත්වය ඉහළ නැංවීම සහ ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමයි.

### 3.2 මෙහෙවර (Mission)

ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි හි මෙහෙවර වන්නේ, සැලසුම්කරණයේ ඒකාබද්ධතාව, ක්‍රියාවට නැංවීමේ, සහ අධීක්ෂණයේ, සහ ඇගයීමේ දැඩි සම්බන්ධීකරණයට හැකියාව සලසන සමාජ ආරක්ෂණයක් වෙත සියලු පුරවැසියන් හට ප්‍රවේශය සලසන ඵලදායී හා කාර්යක්ෂම සමාජ ආරක්ෂණ පද්ධතියක් සංවර්ධනය කර කළමනාකරණය කිරීමයි.

## 3.3 ප්‍රතිපත්තියෙහි අරමුණු (Policy Objective)

ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි  අරමුණ වන්නේ, සියලු පුරවැසියන් හට තම ජීවන චක්‍රය පුරාවට, අවශ්‍ය අවස්ථාවන් හි දී ප්‍රවේශ වීමේ හැකියාවැති සුදුසු සමාජ ආරක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීමයි.  තවද, සෑවොම වෙනුවෙන් ප්‍රමාණවත් සමාජ ආරක්ෂණයක් සහතික කිරීම පිණිස එක්ව කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඇති රාජ්‍ය සහ පෞද්ගලික අංශ වල මෙන්ම රාජ්‍ය-නොවන සංවිධාන වල පාශර්වකරුවන් ද උදෙසා, මනා සම්බන්ධීකරණය හා අනුරූපී බව සහිත සමාජ ආරක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා ක්‍රමෝපායික මගපෙන්වුමක් ලබා දීමටත් ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය අදහස් කරයි.  එය වත්මන් පද්ධතියේ දුවර්ලතා ආමන්ත්‍රණය කරන අතර සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, අයවැය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත කායර්රාමුවක් ගෙනහැර දක්වයි. අංශයට සම්බන්ධීකරණ සහ උපාය මාගර්ික ප්‍රවේශයක් සහතික කිරීම සඳහා පැවතිය යුතු පුළුල් ප්‍රතිපත්ති රාමුව ද එමඟින් හඳුනා ගනී.

# 4. ප්‍රතිපත්ති ප්‍රකාශන (Policy Statements)

මෙම කොටසෙහි දක්වා ඇති ප්‍රතිපත්ති ප්‍රකාශන වල අඩංගු සිදු කරන කටයුතු, ඉහළ-මට්ටමකින් යුතු ඒවා ය.  මෙම ප්‍රතිපත්තියේ දී ශ්‍රී ලංකා රජය ඒවා ඉටු කිරීමට කැප වී සිටින අතර, මෙම ප්‍රතිපත්තියෙහි අරමුණු සාක්ෂාත් කරගැනීමෙහි ලා ඒ එක් එක් කටයුත්ත බෙහෙවින් වැදගත් වේ. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය තුළින් දිරිගන්වනු ලබන මෙකී ප්‍රතිපත්ති ප්‍රකාශන නිමර්ාණය කර ඇත්තේ, සමෝධානික සමාජ ආරක්ෂණ පද්ධතියෙහි වැදගත් අංග විස්තර කිරීමට ය.  ඒ අනුව, ශ්‍රී ලංකා රජය පහත පරිදි කටයුතු කරනු ඇත:

1. දිළිඳු හා අවදානමට ලක් වූවන් වෙත විශේෂ අවධානයක් සහිතව සියලු පුරවැසියන් ඔවුන්ගේ ජීවන චක්‍රය පුරාවට ආවරණය කෙරෙන විශ්වීය සමාජ ආරක්ෂණයක් ප්‍රගතියකින් යුතුව ඉටු කිරීමට.

2. රටෙහි සියලු පුරවැසියන් අතර අවම මට්ටමක යහපැවැත්මක් සහතික කිරීම පිණිස, අවදානමට ලක් විය හැකි සියලු කොට්ඨාසයන්ට (ඵලදායී, තිරසර, හා සමෝධානික පද්ධතියක් හරහා) ප්‍රමාණවත් සමාජ සහනාධාර සඳහා ප්‍රවේශය සහතික කිරීමට.

3. රැකවරණය අවශ්‍ය අය/තමන් රැක බලා ගැනීමේ හැකියාව නොමැති අය හට ප්‍රමාණවත් රැකවරණය වෙත ප්‍රවේශය පවතින බවට සහතික කිරීමට.

4. එකිනෙකට බලපෑම් ඇති කරවනසුලු සහ ස්වචාර (යම් යම් අයට විශේෂ වූ දෑ පිළිබඳ) කම්පන වලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගනීම පිණිස, සියලු පුරවැසියන් සඳහා ප්‍රමාණවත් සහ දැරිය හැකි සමාජ රක්ෂණ වැඩසටහන් වෙත ප්‍රවේශය ඇති බව සහතික කිරීමට.

5. සුනිසි රැකියා/ඵලදායී රැකියා වෙත ප්‍රවේශය ඉහළ නැංවීමට, හා ශ්‍රම වෙළඳපොළ සහ දිළිඳු අය අතර ස්වයං-රැකියා හා වැටුප් සහිත රැකියා දිරිගැන්වීමේ ප්‍රතිපාදන හා පුහුණු වැනි සමෝධානික සේවා පැකේජ සැපයීම ඇතුළත් වැඩසටහන් (productive inclusion programmes) තුළින් තිරසර ජීවනෝපායයන් නිමර්ාණයට පහසුකරණය සැපයීමට.

6. සමාජ ආරක්ෂණ වැඩසටහන් සහ පද්ධති අතර පෙළගැස්ම, සම්බන්ධීකරණය සහ අනුරූපී භාවය ඇති කිරීමට.

7. සමාජ ආරක්ෂණය පිළිබඳ ජාතික දැක්ම ප්‍රගතියකින් යුතුව සපුරාලීම උදෙසා දිගු-කාලීන, තිරසර මූල්‍යකරණය වෙත පහසුකම් සැපයීමට.

ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර් (NSPS) මගින් ඉහත කී එක් එක් ප්‍රතිපත්ති ප්‍රකාශනය සවිස්තරාත්මකට ගෙනහැර දක්වනු ඇත. ඒ සඳහා, එක් එක් ප්‍රතිපත්ති ප්‍රකාශනය ඵලදායී අයුරින් සිදු කෙරෙන බව සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාගර් සම්බන්ධයෙන් වැඩි විස්තර සපයනු ඇත.

## 5. අදාළත්වය (Applicability)

ශ්‍රී ලංකාවේ ජාතික හා උප-ජාතික මට්ටම් වල දී සමාජ ආරක්ෂණයෙහි සැලසුම්කරණය, ක්‍රියාවට නැංවීම සහ අධීක්ෂණය උදෙසා වන දිගු-කාලීන උපායමාගර්ික දැක්ම සවිමත් කිරීම ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් සිදු කෙරෙයි. සමාජ ආරක්ෂණ වැඩසටහන් එකිනෙකට බැඳී පවතින අතර ජාතික හා උප-ජාතික මට්ටම් වලින් ඒවා ක්‍රියාත්මක කිරීම රජයේ නියෝජිතායතන කිහිපයක්

විසින් ම සිදු කරනු ලබයි. කරුණු එසේ හෙයින්, රට වෙනුවෙන් සමෝධානික සමාජ ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශයක් දිරිගැන්වීම සඳහා වන සමස්ත මගපෙන්වුමක් සැපයීම ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් සිදු කරනු ලබයි.

## 6. ක්‍රියාත්මක කිරීම (Implementation)

රේඛීය නියෝජිතායතන අතරින් සැලකිය යුතු කොටසක් විසින් ජාතික හා උප-ජාතික මට්ටමින් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත. එබැවින් ක්ෂේත්‍රයට නායකත්වය ලබාදීම, සහ ඒකාබද්ධතාව වෙත පහසුකරණය සැලසීම පිණිස අන්තර්-අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවක් (මෙහි මින් ඉදිරියට 'කමිටුව' යනුවෙන් හැඳින්වේ) පත් කරනු ඇත. ක්‍රමසම්පාදනය විෂය සම්බන්ධයෙන් කටයුතු පවරා ඇති අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම කමිටුවෙහි සභාපතීත්වය දරනු ඇත.

මෙම කමිටුව ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අදාළ සියලුම අමාත්‍යාංශ වල සියලුම ලේකම්වරු සහ අදාළ අතිරේක ලේකම්වරු හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරුන් ගෙන් ද සමන්විත බහු-පාශර්වික-එකක් වනු ඇත. පෞද්ගලික අංශයේ නියෝජිතයන් සහ සිවිල් සමාජ හා සංවධර්න හවුල්කරුවන්ගේ නියෝජිතයන් ද මෙම කමිටුව වෙත ආරාධනා ලබනු ඇත. ජාතික ක්‍රමසම්පාදනය විෂයය පැවරී ඇති දෙපාතර්මේන්තුව විසින් තාක්ෂණික සහය සලසනු ඇත.

කමිටුව, (i) අදාළ ක්ෂේත්‍රය පාලනය කරනු ලබන නීති සම්පාදන යෝජනා කිරීම සහ ප්‍රතිපත්ති/ උපායමාගර් සකස් කිරීමට, සහ (ii) සමාජ ආරක්ෂණ සේවාවන් සියල්ල සමෝධානික හා කායර්ක්ෂම අන්දමින් සලසනු ලබන බව සහතික කරමින් ජාතික හා උප-ජාතික මට්ටමින් ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය හි සම්බන්ධීකරණය, ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය සහ ඇගයීම සිදුකිරීමට වගකියනු ඇත. කමිටුව විසින් ප්‍රතිඵල වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම පිණිස ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර් හි ඉස්මතු කර දක්වා ඇති ඉලක්ක හා මූලික කායර්සාධන දශර්ක යොදා ගනු ඇත. අවම වශයෙන් – කාතර්ුවකට වරක් රැස්වීමට කමිටුව විසින් කටයුතු කරනු ඇත. අවශ්‍යතා-පදනම මත රැස්වීම් වාර ගණන ඉහළ නැංවීම සභාපතිවරයාට තීරණය කළ හැකි වේ.

ක්‍රියාකාරකම්, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සහ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ක්‍රියාවට නැංවීමෙ එක් එක් අමාත්‍යාංශයෙහි අතිරේක ලේකම් හෝ අධ්‍යක්ෂ-ජනරාල් මට්ටමින් වන කේන්ද්‍රීය පුද්ගලයකු ද එහි සිටිනු ඇත. ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, සමාලෝචනය සහ ප්‍රගතිය අධීක්ෂණය, කායර් සැලසුම් සහ නිශ්චිත කාලවකවානු යාවත්කාලීන කිරීම සහ කමිටුවෙහි අවධානය යොමු කළ යුතු වාතර්ා සැකසීම ආදී කටයුතු උදෙසා, කේන්ද්‍රීය පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් ද අවම වශයෙන්- කාතර්ුවකට වරක් රැස්වීමට කටයුතු කරනු ඇත.

## 7. නිර්වචන (Definitions)

**අනුවර්තීය සමාජ ආරක්ෂණ (Adaptive social protection):** කම්පන(shocks) වලට සූදානම් වීම සඳහා, ඒවාට සාර්ථකව මුහුණ දීමට සහ ඒවාට අනුහුරු වීමට කුටුම්භ වෙත උපකාරී වනු ඇති වැඩසටහන් සහ මැදිහත්වීම් මාලාවක් හරහා ඔවුන්ගේ යහ-පැවැත්ම ආරක්ෂා කරමින්, ඔවුන් දිළිඳු බවට පත් නොවන බැව් හෝ දිළිඳු භාවයේ සිර නොවී සිටින බව තහවුරු කිරීම. මෙකී පද්ධති වල පරිමාණයන් (එනම් පද්ධති වල පරාසයන්, එහි ඇති වැදගත්කම ආදිය) ඉක්මනින් ඉහළ සහ පහළ යා හැකි වේ. කම්පන සහ අබර්ද සහිත කාල වල දී එය විශේෂයෙන්ම සිදු විය හැකිය. පද්ධතියක් පුළුල්කරණයට ලක් කිරීම අතිශයින් වැදගත් වන්නේ එවැනි අවස්ථාවන් හි දී ය. එකී පුළුල් කිරීම සමස්තයක් ලෙසට කළ යුතු වේ. එනම්, සමාජ ආරක්ෂණ පද්ධති මගින් වැඩි පිරිසක් ආවරණය කිරීමයි. නැතිනම් එය සෘජු ලෙස කළ යුතු වේ. එනම්, එම පිරිසම වඩාත් ගැඹුරින් සහ ඉහළ ප්‍රතිලාභ සහිත වන පරිදි ආවරණය කිරීමයි. කම්පන වලට ප්‍රතිචාර දක්වන සමාජ ආරක්ෂණය ලෙසට ද ඒවා හැඳින්වේ.

**සවිබලගැන්වීම (Graduation)**: මින් අදහස් කෙරෙන්නේ, පුද්ගලයන් හට දිළිඳු භාවයෙන් ගැලවීමට උපකාරී වීමට ඉලක්ක කිරීම සහ අදියරගත කළ, දැඩි සහ පරිපූර්ණ සහය පැකේජ ලබාදීම තුළින් ඔරොත්තු දීමේ හැකියාවැති හා තිරසර ජීවනෝපාය මාගර්යන් වෙත ඔවුන් යොමු කිරීමයි. තාක්ෂණික සහ ජීවන කුසලතා පුහුණු, මූල්‍ය ඇතුළත් භාවය, සහ පුහුණු කිරීම හා උපදේශනය සමග මුසු කරන ලද ඉලක්කගත සමාජ සහනාධාර, මෙකී සහය පැකේජ වලට ඇතුළත් කළ හැකි වේ.

<u>ශ්‍රම වෙළඳපොළ සහ දිළිඳු අය අතර ස්වයං-රැකියා හා වැටුප් සහිත රැකියා දිරිගැන්වීමේ ප්‍රතිපාදන හා පුහුණු වැනි සමෝධානික සේවා පැකේජ[3] සැපයීම ඇතුළත් වැඩසටහන් **(Labour market and productive inclusion programmes)**</u>, යනු, නිෂ්ක්‍රීය (රැකියා නොමැති අයට මූල්‍ය සහය දෙන නමුත් රැකියා අවස්ථා ලබා නොදෙන) සහ සක්‍රීය (රැකියා නොමැති අය සෘජුව ම ශ්‍රම වෙළඳපොළ වෙත ප්‍රවේශය ඉහළ නංවන) යන දෙයාකාරයේ ම මැදිහත්වීම් ඇතුළත් වන වැඩසටහන් ය. ඒවා මගින් සුනිසි රැකියා න්‍යායපත්‍රයකට දායකත්වය සැපයේ. විරැකියාවේ සහ නියමිත කාලයට පෙර විශ්‍රාම ගනු ලබන අයගේ වියදම් හා බැඳුණු ප්‍රතිපත්ති (Passive labour market policies) සහ වැඩසටහන් වලට මූලික කම්කරු ප්‍රමිතීන්, රැකියා සුරක්ෂිතතා ප්‍රතිපාදන, සහ සේවාස්ථාන වල හා සිදු කරන කායර්යන් හි දියුණුව වෙත දක්වන අනුකූලතාව ද අයත් වේ. සක්‍රීය වැඩසටහන් මගින් තනි පුද්ගලයන්ගේ මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම සිදු කරනු ලබන්නේ රැකියාවේ නිරතවෙමින් පුහුණුව ලැබීම ඇතුළු පුහුණු සඳහා සහය ලබාදීමත්, අතරමැදි සේවාවන් හා රැකියා නිමර්ාණය

---

[3] මෙම ප්‍රතිපත්තියට අයත් කායර්රාමුව තුළ දී, ශ්‍රම වෙළඳපොළ සම්බන්ධයෙන් මැදිහත්වීම් වලට ඇති ඉල්ලුම ආශ්‍රිත ප්‍රතිපත්ති ගැන සාකච්ඡා කරනු නොලබයි.

තුළින් රැකියා අවස්ථාවන්ට පහසුකරණය සැලසීමත් මගිනි. සමෝධානික සේවා පැකේජ සැපයීම ඇතුළත් වැඩසටහන් මගින් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වලට තිරසර ජීවනෝපාය අවස්ථා උදා කරගැනීමට සහය දෙන්නේ මූල්‍ය සහය, පුහුණු ලබාදීම සහ පුහුණු කිරීම හා උපදේශනය ඇතුළත් මැදිහත්වීමේ පැකේජයක් හරහා ය. මිනිසුන්ගේ ජීවිත වල වැඩිදියුණුව උදෙසා, විශේෂයෙන්ම වඩාත් දිළිඳු පුද්ගලයන්ගේ ජීවිත වල දියුණුව උදෙසා මෙකී වැඩසටහන් අත්‍යාවශ්‍ය වේ. මූලික ආදායම් ලැබිය හැකි පවුල් වල පරිභෝජන අවශ්‍යතා සපුරාලීමට සමත් ප්‍රධානතම මාගර්ය රැකියාවන් බව පෙන්වා දිය යුතු වේ. (ශ්‍රම වෙළඳපොළ තුළ ඉල්ලුම-පැත්තෙන් පවතින ගැටලු, මෙකී සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි කොටසක් වශයෙන් සලකා නැත. එබැවින් ඒ සම්බන්ධයෙන් නිසි කටයුතු යෙදීම ගැන සඳහනක් මෙහි නැත).

ජීවන චක්‍ර ප්‍රවේශය (**Life cycle approach**): ඒ ඒ පුද්ගලයින් සිය ජීවිත වල විවිධ අදියරයන් හි දී එකිනෙකට වෙනස් අවදානම් සහ අවදානමට ලක්විය හැකි භාවයන්ට මුහුණ පාන බැව් සමාජ ආරක්ෂණය සඳහා වන ජීවන චක්‍ර ප්‍රවේශයේ දී හඳුනා ගැනෙයි. එසේම, එක් එක් අදියරයන් හි දී ඇති වන මෙකී අවදානම් සම්බන්ධයෙන් නිසි කටයුතු යොදමින් සමාජ ආරක්ෂණ වැඩසටහන් නිමර්ාණය කළ හැකි බව ද එහිදී හඳුනා ගැනෙයි. අවදානම් කළමනාකරණය සතු ද්විත්ව කායර්භාරය ගැන ද එමගින් අවධාරණය කෙරෙයි - එනම්, මූලික ජීවනෝපායයන් ආරක්ෂා කිරීම මෙන් ම අවදානම් ගැනීමට දිරි ගැන්වීම ද වේ. අවදානමට ලක්විය හැකි වැඩි අවදානමක් සහිත සහ ස්වාභාවයෙන්ම අවදානම් කළමනාකරණ උපකාරක කිසිවක්ම නොමැති නිසා අවදානම් සහගත වූ කටයුතු වල නියැලීමේ මෙන්ම ඉහළ ආදායම් ලැබිය හැකි ක්‍රියාකාරකම් වල යෙදීමේ සීමා පැනවෙන - දිළිඳු අය හට - තමන් බොහෝ කාලයක් පුරාවට ඇද වැටී සිටි දිළිඳු තත්ත්වයෙන් පිටතට පැමිණීමේ අවස්ථාව මේ හරහා ලැබේ.

ලැබුම්කරුවා` (**Recipient**) : යම් කිසි විශේෂිත වේලාවක දී හෝ යම් කාලසීමාවක් තුළ දී හෝ තනි පුද්ගලයන් හෝ පුද්ගලයන්/ කුටුම්භ විසින් ලබනු ඇති ප්‍රතිලාභ.

අවදානම (**Risk**): විවිධ ආකාරයේ අවදානම් ඇත. ඒ අතර, (i) පුද්ගල ජීවන චක්‍රය, (ii) ආථර්ිකය, (iii) පරිසරය, සහ (iv) පාලනය ආශ්‍රිත අවදානම් ද වේ. මෙකී කම්පන(shocks) තනි පුද්ගලයන්ට, ප්‍රජාවන්ට, සහ කලාප වලට තදින්ම බලපෑ හැකි අතර, ඒවා බොහෝ විට සිදු වන්නේ පුරෝකථනය කළ නොහැකි හෝ වැළැක්විය නොහැකි හෝ ආකාරයෙනි. එම නිසා, ඒවා දිළිඳු භාවය ඇති කිරීමටත්, පවත්නා දිළිඳු භාවය තව තවත් උග්‍ර බවට පත් කිරීමටත් හේතු වේ. අවදානම යනු ඉතාමත් ක්‍රියාශීලී, වේගයෙන් වෙනස් වන සංකල්පයකි - අනාරක්ෂිත බව යනු, සිදු වුවහොත්, තව දුරටත් අවදානමට පත් කෙරෙනු ඇති සිදුවීම් මාලාවක අවදානම් වලට නිරාවරණය වීමයි.

සමාජ සහනාධාර (**Social Assistance**): සමාජ සහනාධාර නිවර්චනය කෙරෙන්නේ, කිසියම් අවම මට්ටමක ආර්ථික යහපැවැත්මක් සහතික කිරීම මගින් කුටුම්භ දිළිඳු බවින් සහ අන්ත දුගී බවින් රැක ගැනීමට නිමර්ාණය කළ වැඩසටහන් හෝ ආරක්ෂක ක්‍රියාමාගර් ලෙසයි. බොහෝ විට ඒවා නිමර්ාණය කරන්නේ, ලැබුම්කාර කුටුම්භ වල මානව සහ භෞතික ප්‍රාග්ධනය වෙත ආයෝජනය වැඩිදියුණු කිරීම තුළින් දිරිගැන්වීමේ කායර්භාරයක් ඉටු කිරීමට හා දිළිඳු බවින් මිදීම වෙනුවෙන් සහ අනාගත දිළිඳු බව මගහරවා ගැනීමට කුටුම්භ වලට සහය වීමයි.

සමාජ රැකවරණය (**Social Care**): සමාජ රැකවරණය යනුවෙන් හැඳින්වෙන්නේ, තමන් රැකබලා ගැනීමේ හැකියාවක් නොමැති පුද්ගලයන් වෙත සහය සලසන ක්‍රියාකාරකම් සහ සේවාවන් රැසකි; තනි පුද්ගලයින්ගේ/පවුල් වල සහ පුළුල් සමාජයේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම හෝ දිරිගැන්වීම අරමුණු කරගෙන නිමර්ාණය කළ ක්‍රියාකාරම් සහ සම්පත් ය; සහ සමාජයීය ගැටුම් සීමා කිරීමට ගනු ලබන වෑයම් ය.

සමාජ රක්ෂණය (**Social insurance**), සමාජ රක්ෂණය යන්නට මහලු වයස, ආබාධ තත්ත්වයන්, ගෘහමූලික (නිවසේ අවශ්‍යතා සපුරාලන ප්‍රධානියා) මරණයට පත්වීම, රෝගී තත්ත්වයන් මෙන්ම විවිධ සෞඛ්‍යමය සහ ආර්ථික කම්පන සම්බන්ධයෙන් සපයනු ලබන හෝ ලබාදීමට නියමිතව පවතින හෝ රක්ෂණ අයත් වේ. සමාජ රක්ෂණ බොහෝ විට විධිමත් හෝ අවිධිමත් රැකියාවන් - ආශ්‍රිතව සපයනු ලබන වැඩසටහන් ය. නිල හෝ නිල නොවන විධිමත් හෝ අවිධිමත් රැකියාවන් නියුක්තිය හා සම්බන්ධ වැඩසටහන් ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, දායකත්වය සහිත සහ දායකත්වය රහිත රක්ෂණ යෝජනා ක්‍රම, සමාජ රක්ෂණ වශයෙන් සලකනු ලබයි.

සමාජ ආරක්ෂණය (**Social Protection**): තනි පුද්ගලයින්ට සහ සමාජයන්ට අවදානම් හා අස්ථාවරත්වය කළමනාකරණයට සහය දීම, දිළිඳු බවින් හා අසමානාත්මතා වලින් ඔවුන් සුරැකීම, සහ ජීවන චක්‍රය පුරාවටම ඔවුන්ට ආර්ථික අවස්ථාවන් වෙත ප්‍රවේශය සැලසීම ආදියට සමාජ ආරක්ෂණය ප්‍රතිපත්ති හා වැඩසටහන් උපකාරී වේ. සමාජ ආරක්ෂණයේ ඉලක්ක තුන ලෙසට සැලකෙන පුද්ගලයින්ගේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම, සාධාරණත්වය සහ අවස්ථාවන් සැලසීම මගින් එය සාක්ෂාත් කරගැනීම සමාජ ආරක්ෂණය යනුවෙන් අදහස් කරයි. මෙකී ඉලක්ක තුන වෙනුවෙන්, සමාජ රක්ෂණය, සහ ශ්‍රම වෙළඳපොළ සහ දිළිඳු අය අතර ස්වයං-රැකියා හා වැටුප් සහිත රැකියා දිරිගැන්වීමේ ප්‍රතිපාදන හා පුහුණු වැනි සමෝධානික සේවා පැකේජ සැපයීම ඇතුළත් වැඩසටහන් (productive inclusion programmes) ආදී වශයෙන් උපකාරී වන තවත් කරුණු රැසක් යොදා ගැනෙයි.

තිරසර බව (**Sustainability**): දිගු කාලසීමාවක් පුරාවට යම් මැදිහත් වීමක් අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව.

## ඇමුණුම 1. අදාළ ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය (Annex 1. Social Protection Policies and Legislation)

- 2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත
- 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත
- 2013 අංක 1 දරන දිවිනැගුම පනත (1995, සමෘද්ධි අධිකාරී පනත ප්‍රතිස්ථාපනය කරමින්)
- වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ 2011 අංක 5 පනතින් පසුකාලීනව සංශෝධිත, 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත
- 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත
- 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත (සහ පසුකාලීනව සංශෝධිත, වඩාත් මෑත-කාලීන අධ්‍යාපන (පදවිනාම වෙනස් කිරීම) නීතිය(1973 අංක 35 දරන)
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත (1981 අංක 66 දරන)
- 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවකයින් (රැකියා වේතන නියාමන) පනත (සහ පසුකාලීනව සංශෝධිත, වඩාත් (2018 අංක 14 දරන )මෑත-කාලීන ව ප්‍රත්‍යාශයට පත් කළ සාප්පු සහ කාර්යාල සේවක (රැකියා සහ වේතන නියාමනය) (සංශෝධිත) පනත
- විශ්‍රාම වැටුප් සංග්‍රහය (1947 අංක 2 දරන ආඥා පනත)
- 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත, 2018 අංක 15 දරන ප්‍රසූතිකාධාර (සංශෝධිත) පනත
- 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත
- 1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික සංග්‍රහය
- 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික සංග්‍රහය
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත (431 පරිච්ඡේදය) සහ 1983 අංක 24 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත
- 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනත
- 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
- 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
- 1941 අංක 27 දරන වැටුප් මණ්ඩල ආඥා පනත
- 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත

- 2002 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත
- 1941 අංක 22 දරන අනත්දරු නිවාස ආඥා පනත
- 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත
- 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත
- 1981 අංක 72 දරන වැඩිලි කම්කරාන්ත සේවකයන්ට දීමනා පනත
- 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත
- 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත (BRAWA)
- 1985 අංක 21 දරන විදේශ රැකියා පනත
- සුනිසි රැකියා වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තිය (2006)
- ශ්‍රී ලාංකික ළමයින් සඳහා වූ විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය (2019)
- ශ්‍රී ලංකාවේ ආබාධිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2003)
- ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ ජාතික ප්‍රඥප්තිය (2006)

## ඇමුණුම 2. ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර්යේ දළ සැලැස්ම: 2030 කරා ගමන්මග (Annex 2. Outline of National Social Protection Strategy: Road to 2030)

සැලකිය යුතුයි: ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර්ය (NSPS), ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය (NSPP) සමග පෙළගැස්වීම සිදු කෙරෙනු ඇත. එහිදී, අන්තගර්තය සම්බන්ධයෙන් යම් යම් එක හා සමාන ආකාරයේ කරුණු (නිවර්චන, විෂයපථය, දැක්ම, මෙහෙවර, මූලධමර්) අඩංගු විය හැකි බැවින්, ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර්ය තනි ලේඛනයක් වශයෙන් සැලකිය හැකිය. අනෙකුත් කොටස්, ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ලේඛනයෙහි විස්තර කර දැක්වෙනු ඇත.

පෙරවදන: ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, හෝ විෂය භාර අමාත්‍යවරයා විසින් ලබාදීමට නියමිතයි.

විධායක සාරාංශය: ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර්ය පිළිබඳව පිටු 1-2 දක්වා වන සාරාංශයක් සපයයි.

1 හැඳින්වීම (**Introduction**): සමාජ ආරක්ෂණය සහ එහි විෂය පථය නිවර්චනය කරන අතර, ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර්යෙහි අවශ්‍යතාව පැහැදිලිව ප්‍රකාශ කරයි. ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියෙහි නිවර්චනය කර ඇති ආධාරක 4 සමග විෂය පථය පෙළගැස්විය හැකිය. එකී ආධාරක සතර නම්: (i) සමාජ සහනාධාර (ii) සමාජ රක්ෂණ (iii) සමාජ

රැකවරණය (iv) ශ්‍රම වෙළඳපොළ සහ දිළිඳු අය අතර ස්වයං-රැකියා හා වැටුප් සහිත රැකියා දිරිගැන්වීමේ ප්‍රතිපාදන හා පුහුණු වැනි සමෝධානික සේවා පැකේජ සැපයීම ඇතුළත් වැඩසටහන් (productive inclusion programmes).

2 වත්මන් සමාජ ආරක්ෂණ පසුබිම (**Current Social Protection Landscape**): නීතිමය, ආයතනික, සහ වැඩසටහන් සඳහා විශේෂ කරුණු වෙත අවධානය යොමු කරමින්, පවත්නා සමාජ ආරක්ෂණ පසුබිම පිළිබඳ ඇගයුමක් ලබා දේ. ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) විවිධ මට්ටම් වල දී කොටස් වශයෙන් (ඉහළ මට්ටම, ආධාරක මට්ටම) සවිස්තරාත්මකව නිර්වචනය කර, මෙම ඇගයුමේ දී යොදා ගනු ඇත.

3 ක්‍රමෝපායික කාර්යරාමුව (**Strategic Framework**): දැක්ම, මෙහෙවර, සහ ඉලක්ක: ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග මගින් අවධානය යොමු කරන දෑ පැහැදිලිව ප්‍රකාශ කරයි. ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග යෙහි දැක්ම සහ මෙහෙවර, ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සමග පෙළගැස්වෙනු ඇත. 2 වන කොටසෙහි නිර්වචනය කර ඇති ප්‍රධාන කාර්යසාධන දර්ශක වෙත අවධානය යොමු කරමින් ඉලක්ක සැකසීම කරනු ඇත.

4 මූලධර්ම (**Principles**): උපායමාර්ගික කාර්යරාමුව (3 වන කොටස) වෙත අවධානය යොමු කරමින්, මූලික වැඩසටහන් සහ ක්‍රියාවට නැංවීමේ සැලසුම (5 වන සහ 6 වන කොටස්) සංවර්ධනය කිරීමට මගපෙන්වනු ලබන පාදක-මූලධර්ම පෙන්වා දෙයි.

5 ආධාරක මගින් සිදු කරන ප්‍රධානතම උපායමාර්ගික මැදිහත්වීම් (**Key strategic interventions by pillar**): එක් එක් ආධාරකය යටතේ සැලසුම් කර ඇති මූලික වැඩසටහන් පෙන්නුම් කරයි. 3 වන කොටස සහ 4 වන කොටස මගින් පෙන්නුම් කර ඇති ඉලක්ක පෙන්නුම් සාක්ෂාත් කර ගන්නා අයුරු හා අදාළ නිශ්චිත කාලවකවානු ද ඇතුළුව උපායමාර්ගික අරමුණු පැහැදිලි කිරීම සහ වැඩසටහන් වල විස්තර සැපයීම මෙමගින් සිදු කරයි.

5.1 ප්‍රධාන සමාජ සහනාධාර වැඩසටහන්

5.2 ප්‍රධාන සමාජ රක්ෂණ වැඩසටහන්

5.3 ප්‍රධාන සමාජ රැකවරණ වැඩසටහන්

5.4 ශ්‍රම වෙළඳපොළ සහ දිළිඳු අය අතර ස්වයං-රැකියා හා වැටුප් සහිත රැකියා දිරිගැන්වීමේ ප්‍රතිපාදන හා පුහුණු වැනි සමෝධානික සේවා පැකේජ සැපයීමේ ප්‍රධාන ඇතුළත් වැඩසටහන් (productive inclusion programmes)

**6.** **ක්‍රියාත්මක කිරීමේ සැලසුම (Implementation plan): 5 වන කොටස මගින් පෙන්වා ඇති වැඩසටහන් ක්‍රියාවට නැංවීම පිණිස සමාජ ආරක්ෂණය සඳහා වන ඉහළ-මට්ටමේ ක්‍රියාවට නැංවීමේ සැලසුම සවිස්තරාත්මකව පැහැදිලි කරයි. මෙයට, අනු-කොටස් 4ක් ඇතුළත් වනු ඇත.**

6.1 **පාලනය: සමාජ ආරක්ෂණය පාලනය කිරීමෙහි ආයතනික කායර්රාමුව ඉස්මතු කර පෙන්වයි.**

6.2 **සම්බන්ධීකරණය: රජයෙහි අභ්‍යන්තර හා ඉන් පරිබාහිර සම්බන්ධීකරණය පිළිබඳ යාන්ත්‍රණ ඉස්මතු කර පෙන්වයි.**

6.3 **මූල්‍යකරණය: ජාතික සමාජ ආරක්ෂණ උපායමාගර් හි විස්තර කර ඇති වැඩසටහන් වලට මූල්‍ය පහසුකම් සැපයීමේ ක්‍රමෝපායයන් ඉස්මතු කර පෙන්වයි.**
**ස්වෙච්ඡා දායකත්වයන්**
**අනිවායර් දායකත්වයන්**
**මූලික අවශ්‍යතා, සාමාන්‍යයෙන් රජය විසින් සපයනු ලබන්නා වූ**

6.4 **අධීක්ෂණය සහ ඇගයුම (Monitoring & Evaluation -M&E): ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ හා ඇගයීමේ යාන්ත්‍රණ ඉස්මතු කරමින්, 2 වන කොටසෙහි පැහැදිලි කර ඇති ප්‍රධාන කායර්සාධන දශර්ක වෙත අවධානය යොමු කරන අතර, වැඩසටහන් වලට විශේෂිත වූ වඩාත් සවිස්තරාත්මක ප්‍රධාන කායර්සාධන දශර්ක ලබා දේ. වැඩසටහන් නිමර්ාණය වැඩිදියුණු කිරීමට සහ අධීක්ෂණය සහ ඇගයීම මත පදනම්ව, වැඩසටහන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යාන්ත්‍රණ ද සාකච්ඡා කෙරෙනු ඇත.**

**ඇමුණුම (Annex): ප්‍රමුඛ පෙළේ නියෝජිතායතන මෙන්ම යෝජිත අය-වැය ද ඇතුළුව, සමාජ ආරක්ෂණ වැඩසටහන් පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් සපයනු ලබයි.**